# ලංකාණ්ඩුවේ "ගැසට්" පත්‍රය.

ආණ්ඩුවේ අවසරයපිට ප්‍රසිඩකරණලදී.

නො. 7,058 — 1919ක්වූ ඔක්තෝබර් මස 17වෙනි දිනවූ සිකුරාදා.


# Part IV.—හතරවෙනි කාණ්ඩය.

---

### උපාඩ්‍යනීති.

වර්ෂ 1916යේ නොම්මර 15හේ ආඥාපණතේ 9වෙනි වගන්තියෙන් වෙනස්කරණලද වර්ෂ 1896යේ නොම්මර 20 දරන ආඥාපණතේ 30 (2A) වෙනි වගන්තියට අනුකූලව නුවරඑලියේ නාගරාභිවෘද්ධික සභාව විසින් සාදනලදුව ගරුතර ආණ්ඩුකාර උතුමාණන්වහන්සේ විසින් කාරක මන්ත්‍රිසභාවේ උපදෙස් පිට ස්ථිරකරනලද අතුරුපනත.

උමාණන්වහන්සේගේ අණපරිද්දෙන්,

වර්ෂ 1919ක්වූ ඔක්තෝබර් මස 13වෙනි දින කොළඹ මහලේකම්තාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

ඒ. ඇස්. පැග්ඩන්,
වැඩබලන මහලේකම්තාරිස් වර්‍ගය.

### ඉහතකී අතුරුපනත.

නාගරාභිවෘද්ධික සභාවේ සභාපතිතැනගෙන් අවසරපත්‍රයක් නැතුවද එවැනි අවසරපත්‍රයක සඳහන්වන මාසිම් සහ වේලාවල් ඉක්මවාද කිසිවෙකුට නුවරඑලියේ නාගරික මාසිම් තුළ පිහිටි කිසිම වීථියක දේශනාකිරීමට හෝ යම් රැස්වීමකට කථාවක්කිරීමට හෝ රැස්වීමක් පවත්වන්ට හෝ බැරිය.

---

### ආණ්ඩුවේ ඉඩම් විකිණීම හෝ බදුදීම සඳහා දැන්වීම.

**No. 3,484, S. P.**—දකුණු දිසාවේ මාතර උපප්ජන්ත උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වර්ෂ 1919ක්වූ දෙසැම්බර් මස 4වෙනි දිනවූ බ්‍රහස්පතින්දා උදේ 11ට මාතර කච්චේරියේදී වෙන්දේසිකර විකුණන්ට හෝ බේරුම්කරදෙන්ට නොහොත් වෙන අන්දමකින් තීන්දුකරන්ට යෙදෙනවා ඇත. දකුණු දිසාවේ මාතර පලාතේ වැලිගම්කෝරළේ පිහිටාතිබෙන බිම්කැබලි 1ක්.

සිතියම 10,726. ගම—හල්ලල. ඉල්ලුම්කාරයා—ආණ්ඩුව.

| නො. | ඉඩමේ නම. | අයිතිකමකියන්නා. | අන්දම. | මහත, අ. රූ. ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|
| 1A | දෙලබොක්කෙහේන .. | ඞී. පී. ඩබ්ලිව්. ගුණතිලක .. | චවාපුහරිය .. | 0 2 18 | 100 |

මෙම ඉඩම ගැන වැඩිදුර කාරණා මාතර උපප්ජන්ත උන්නාන්සේගෙන්ද, එහි සිතියම සර්වේයර් ජනරාල් උන්නාන්සේගෙන්ද ලබාගන්නට පුළුවන.

වර්ෂ 1919ක්වූ ඔක්තෝබර් මස 9වෙනි දින කොළඹ මහලේකම්තාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

ඒ. ඇස්. පැග්ඩන්,
වැඩබලන මහලේකම්තාරිස් වර්‍ගය.

---

**No. 3,585, S. P.**—දකුණු දිසාවේ ආණ්ඩුවේ මහාප්ජන්ත උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වර්ෂ 1919ක්වූ දෙසැම්බර් මස 2වෙනි දිනවූ අඟහරුවාදා පස්වරු 1ට ගාල්ලේ කච්චේරියේදී වෙන්දේසිකර විකුණන්ට හෝ බේරුම්කරදෙන්ට නොහොත් වෙන අන්දමකින් තීන්දුකරන්ට යෙදෙනවා ඇත. දකුණු දිසාවේ ගාල්ල පලාතේ බෙන්තොට වලල්ලාවිටිකෝරළේ කොඩාසයේ පිහිටාතිබෙන බිම්කැබලි 11ක්.

සිතියම 11,136. ගම—නානාතොටපලාත. අයිතිකමකියන්නා—රාජසන්තක.

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා. | අන්දම. | මහත, අ. රූ. ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|
| 1 | දෙල්ගහකැලේ .. | — .. | .. කැලේ (විකිනීමට නොවේ) | 0 1 10 | —* |
| 2 | එම .. | බී. ඞී. ඒ. රාජපක්ෂ, කොස්ගොඩ .. | කැලේ .. .. | 2 3 23 | 82 |
| 3 | එම .. | ජේ. එච්. ඇම්. සිරිවර්ධන, කොස්ගොඩ | එම .. .. | 2 3 29 | 82 |

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා. | අන්දම. | මහත, අ. රූ. ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|
| | අයිතිකමකියන්නා—එච්. එච්. වී. ද සොයිසා ප්‍රසිඞ නොතාරිස්තැන, කොස්ගොඩ. | | | | |
| 5 | දිවියාගල්අරනවත්ත .. | — .. | .. කුරුඳු .. | .. 2 1 26 | 80 |
| | | | වගාව | .. — | 290 |
| | අයිතිකමකියන්නා—රජසන්තක. | | | | |
| 8 | බටලන්දෙකැලේ | .. තේදියස්ප්‍රේරා වික්‍රමරතන, කොස්ගොඩ | කැලේ .. | .. 2 0 7 | 82 |
| 9 | එම | .. සලමන් ප්‍රේරා වික්‍රමරතන, කොස්ගොඩ | එම .. | .. 2 0 22 | 82 |
| 10 | එම | .. — .. | .. කැලේ (විකිනීමට නොවේ) | 0 0 14 | —* |
| 11 | එම | .. — .. | .. එම .. | .. 0 1 9 | —* |
| 12 | එම | .. ඒ. ඞී. මැන්දිස් .. | .. කැලේ.. | .. 1 3 29 | 82 |
| | සිතියම 11,277. ගම—ඌරගහ. | | | | |
| 1 | පරුස්සෙවෙල නොහොත් පරුස්සේඋඹුමුල්ල | ඇල්. පී. ඒ. වික්‍රමරත්න කෝරලේ ආරච්චි, කොස්ගොඩ | .. කුඹුර .. | .. 1 0 0 | 50 |
| | අයිතිකමකියන්නා—තලන්ගමගේ එරෝනිස්අප්පු. | | | | |
| 2 | පරුස්සේගොඩවත්ත .. | එම .. | .. පොල්වත්ත | .. 0 3 37 | 50 |
| | | | වගාව | .. — | 174·50 |
| | අයිතිකමකියන්නා—රජසන්තක. | | | | |
| 3 | පරුස්සෙවෙල නොහොත් පරුස්සේඋඹුමුල්ල .. | එම .. | .. කුඹුර .. | .. 1 0 12 | 50 |
| | අයිතිකමකියන්නා—තලන්ගමගේ එරෝනිස්අප්පු. | | | | |
| 4 | පරුස්සේගොඩවත්ත | .. ඇල්. පී. ඒ. වික්‍රමරත්න කෝරලේ ආරච්චි, කොස්ගොඩ | .. පොල්වත්ත | .. 0 3 15 | 50 |
| | | | වගාව | .. — | 42·50 |
| | අයිතිකමකියන්නා—තලන්ගමගේ ඒරන්සිංඤෝ. | | | | |
| 5 | එම | .. ඇල්. පී. ඒ. වික්‍රමරත්න කෝරලේ ආරච්චි, කොස්ගොඩ | .. එලවළුවත්ත | .. 0 1 17 | 50 |

* තහනම් ඉඩම්.

මෙම ඉඩම් ගැණ වැඩිදුර විස්තර ගාල්ලේ මහාඒජන්ත උන්නාන්සේගෙන්ද, මේවාගේ සිතියම් සර්වේයර් ජනරාල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිවේ.

වර්‍ෂ 1919ක්වූ ඔක්තෝබර් මස 15වෙනි දින කොළඹ මහලේකම්තාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

ඒ. ඇස්. පැග්ඩන්,
වැඩබලන මහලේකම්තාරිස් වර්‍ෂ.

---

මෙහි පහත නම් සඳහන්කරනුලබන රජසන්තක ඉඩම් කැබලි පොල්, රබර්, කුරුඳු හෝ තේ වැවීමට බද්ද පටන්ගන්න දිනේ පටන් ගණන් ගනිමින් එක එක තිස්අවුරුද්දර වරක් බද්ද අලුත්කරන පංගාර්තුවට යටත්ව වර්‍ෂ 1920ක්වූ ජනවාරි මස 2වෙනි දින පටන් කාලසීමාවක් නැතුව බදුගැනීමට කරන ඉල්ලුම්පත්‍ර වර්‍ෂ 1919ක්වූ නොවැම්බර් මස 7වෙනි දිනට නොහොත් ඊට කල්මත්තෙන් ආණ්ඩුවේ ඒජන්තතුමා විසින් භාරගනු ලැබේ. ඉල්ලුම්කාරයා ඔහුගේ සම්පූර්ණ නම ගම සහ ලියුම් ලැබෙන ස්ථානය දක්නුම් කුදුන්නොත්ද එක එක ඉඩම් කැබෙල්ලට සටහන්කර තිබෙන මිනින්දෝරු ගාස්තුව ආණ්ඩුවේ ඒජන්තතුමා වෙත බඳිනතුරුද එකී ඉල්ලුම්පත්‍රයක් භාරගනු නොලැබේ. ඉඩමේ බද්ද විකුණනතුරු නොහොත් ආණ්ඩුවේ ඒජන්තතුමා විසින් ඉඩම නොවිකුණන්ට නියමකළොත් එසේ නියමකරනතුරු එකී බැඳපු මුදල ආපසු දෙනු නොලැබේ. වර්‍ෂ 1919ක්වූ දෙසැම්බර් මස 2වෙනි දිනවූ අඟහරුවාදා පස්වරු 1ට ගාල්ලේ කච්චේරියේදී බදු විකිණීම රජසන්තක ඉඩම්වල බදු විකිණීම සම්බන්ධ ආණ්ඩුවේ රෙගුලාසිවල ප්‍රකාර ප්‍රසිඞ වෙන්දේසියේ විකුණනු ලැබේ. වැඩි ඉල්ලුම්කාරයා බද්ද ගැණුම්කාරයා වන්නේය.

බද්දේ කොන්දේසි ආණ්ඩුවේ ඒජන්තතුමාගෙන් ලබාගත හැකිය. ඒවාගේ සිතියම් සර්වේයර් ජනරාල් උන්නාන්සේගෙන්ද ලබාගන්නට පුළුවන.

දකුණු පලාතේ ගාළු දිස්ත්‍රික්කේ බෙන්තර වලල්ලාවිටිකෝරලේ පිහිටි ආණ්ඩුව සන්තක ඉඩම් කැබලි 3ක්.

මුල් ප්ලෑන් කඩදාසියේ නොම්මරය 10,862. ගම—යටගල.

ඉල්ලුම්කාරයා—ඇල්. පී. ඒ. වික්‍රමරත්න කෝරලේආරච්චි කොස්ගොඩ.

| නො. | ඉඩමේ නම. | විස්තර. | ප්‍රමාණය. අ. රූ. ප. | අක්කරයකට මැනුම් ගාස්තුව. රු. | වෙන්දේසියේ පටන් ගන්න අක්කරයක ප්‍රිමියම් ගණන. රු. ශ. | පළමු තිස් අවුරුද්දට අක්කරයකට අවුරුද්දක බද්ද. එක එක පළමු හයඅවුරුද්දට රු. ශ. | එක එක ඉතිරි විසි හතර අවුරුද්දට. රු. ශ. |
|---|---|---|---|---|---|---|---|
| 7 | දික්කැලේ .. | බැද්ද | .. 1 2 10 | .. 3 | .. 8 10 | .. 1 70 | .. 5 10 |
| 8 | එම .. | එම | .. 1 0 28 | .. (නොම්මර 7 කැබැල්ලත් සමග බදුදෙනු ලැබේ) | | | |
| 9 | දික්කැලේ නොහොත් දික් කැලේඅද්දර ලවල .. | එම | .. 1 1 10 | .. ( එම ) | | | |

වර්‍ෂ 1919ක්වූ ඔක්තෝබර් මස 14වෙනි දින කොළඹ මහලේකම්තාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

ඒ. ඇස්. පැග්ඩන්,
වැඩබලන මහලේකම්තාරිස් වර්‍ෂ.

---

වර්‍ෂ 1919ක්වූ ඔක්තෝබර් මස 3වෙනි දින දහම දරණ නොම්මර 7,055 ගැසට් පත්‍රයේ ප්‍රසිඞව තිබෙන නොම්මර 3,578 දරණ ඉඩම් විකිනීම් නොතිසියේ පෙනියන නොම්මර 3,873 දරණ ප්ලෑනේ සඳහන් නොම්මර අ 403 දරණ බිම්කට්ටිය වර්‍ෂ 1919ක්වූ දෙසැම්බර් මස 16වෙනි දින විකිනීමෙන් අස්කළ බව පොදුජනයාට මෙයින් දන්වමි.

වර්‍ෂ 1919ක්වූ ඔක්තෝබර් මස 10වෙනි දින ගාල්ලේ කච්චේරියේදීය.

වී. කුමාරසාමි,
ඒජන්ත උන්නාන්සේ වෙනුවට.

**No. 2,080, N.C. P.**—උතුරු මධ්‍යම දිසාවේ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වර්‍ෂ 1919ක්වූ දෙසැම්බර් මස 3වෙනි දිනවූ බදාදා පස්වරු 1ට අනුරාධපුර කච්චේරියේදී වෙන්දේසිකර විකුණන්ට හෝ බේරුම්කරදෙන්ට නොහොත් වෙන අන්දමකින් තීන්දුකරන්ට යෙදෙනවා ඇත. උතුරු මධ්‍යම දිසාවේ නුවරකලාවිය දිස්ත්‍රික්කේ නුවරගම් හුරුළු සහ කලාගම්පලාත්වල පිහිටා තිබෙන බිම්කැබලි 21ක්.

සිතියම 5,271. ගම—කල්පේකෝරලේ බන්ඩාරඅමුනුගම. අයිතිකම්කියන්නා—ආණ්ඩුව.

| නො. | ඉඩමේ නම. | නොගෙව්අයගේ නම. | අන්දම. | මහත, අ. රූ. ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|
| 1 | මයිලගහඉඩම | .. බඩහැල ඇතාවැටුනාවේ ඩබ්ලිව්. සිලංබුවා | වත්තට සුදුසු කැලේ | 0 1 27 | 15 |
| | සිතියම F. V. P. 616. ගම—කඩවත්කෝරලේ ඇටඹගස්කඩ. | | | | |
| 2A | ඇටඹගහමූකලාන | .. ඇටඹගස්කඩ ජේ. වී. ගම්මන්පිරල සහ 2ක් | මූකලාන | .. 3 1 38 | 20 |
| | සිතියම P. P. 5,231. ගම—උඩුරුවකෝරලේ හම්මිල්ලෑව. | | | | |
| 1 | මැටිවලේහේන | .. ගම්සභාහම්මිල්ලෑවේ ඩබ්ලිව්. ඇම්. කපුරුහාමි .. | .. කනත්ත | .. 0 3 16 | 15 |
| | සිතියම F. V. P. 275. ගම—නුවරගම්කෝරලේ හග්ගොමුව. | | | | |
| 1F | හග්ගොමුවකැලේ | .. නුවරවැවේ පී. සවුන්කලි අම්මාල් | .. කැලේ | .. 8 2 12 | 52* |
| | සිතියම P. P. 5,043. ගම—මාටඹුවාකෝරලේ කරඹෑව. | | | | |
| 1 | දඹගහලන්ද | .. කේ. කේ. කපුරුහාමි හිටපු ආරච්චිල | .. වියට සුදුසු කැලේ | .. 3 0 25 | 17·50 |
| | සිතියම F. V. P. 254. ගම—කනදරකෝරලේ මහකලත්තෑව. | | | | |
| 3R | මහකලතතැවහේන හෙවත් මහකලත්තැවකැලේ | මහකලත්තෑවේ ඇස්. සින්නයියා සහ තවත් 6දෙනෙක් | .. වියට සුදුසු කැලේ | .. 7 0 38 | 26 |
| | සිතියම F. V. P. 254. ගම—කනදරකෝරලේ මහකලත්තෑව. | | | | |
| 5 | හම්මිලගස්මූකලාන හෙවත් මහකලත්තෑව .. | මහකලතතැවේ ඇස්. සිනානියා සහ තවත් 6දෙනෙක් .. | .. වියට සුදුසු කැලේ | .. 3 3 12 | 26 |
| 7O | මහකලත්තැවකැලේ | .. මහකලතතැවේ ඇස්. කදිරවේලු සහ තවත් අයෙක් .. | .. වියට සුදුසු මූකලාන | 4 1 38 | 26 |
| | සිතියම F. V. P. 162. ගම—කැඳූකෝරලේ මාන්කඩවල. | | | | |
| 10E2 | මාන්කඩවලකැලේ | .. මහදුන්නබිඳුනෑවේ සී. ඇම්. පුංචිරාල ආරච්චිල සහ තවත් අය .. | .. ලඳුකැලේ | .. 6 0 14 | 21·50 |
| | සිතියම F. V. P. 36. ගම—එප්පාවලකෝරලේ නල්ලමුඩව. | | | | |
| 5B | වලහබොඩකැලේ හෙවත් නල්ලමුඩාවකැලේ .. | නල්ලමුදාවේ පී. සිලම්බුරාල සහ තවත් අයෙක් .. | .. කැලේ | .. 0 2 4 | 18 |
| | සිතියම F. V. P. 689. ගම—විලච්චියකෝරලේ ඔලුවැව. | | | | |
| 37A | වෙල්කටුවකොලොංගහයාය | ඩී. කේ. අප්පුහාමි .. | .. හේන | .. 3 2 3 | 20 |
| | සිතියම F. V. P. 685. ගම—විලච්චියකෝරලේ පහලකෙඹිතෝක්කුව. | | | | |
| 1B | ඔබිබේරියවලමූකලාන | .. මැටිකාවේ බී. ඇස්. උක්කුබන්ඩා සහ තව 23දෙනෙක් .. | .. මූකලාන | .. 4 0 3 | 18·50 |
| | සිතියම P. P. 4,481. ගම—උඩිඹියන්කුලම්කෝරලේ පඳුකෙටුවැව. | | | | |
| 2211 | මයිලගහඉඩම | .. බේකෑවේ උක්කුරාලගේ පිකිරිඅප්පු සහ තවත් අයෙක් .. | .. වියට සුදුසු ලඳුකැලේ | 1 0 26 | 20 |
| | සිතියම P. P. 5,303. ගම—කුන්චුට්ටුකෝරලේ පුලියන්කුලම. | | | | |
| 1 | එම | .. මහපුලියන්කුලමේ යූ. කපුරාල සහ තවත් අයෙක් .. | .. වියට සුදුසු ලඳුකැලේ | 2 0 7 | 15 |
| | සිතියම 5,342. ගම—දකුණු කලාගම්කෝරලේ රදගම. | | | | |
| 1 | බෝගහහේන | .. රදගම පී. ජී. පෙරේරා .. | .. කැලේ | .. 1 0 6 | 15 |
| | සිතියම F. V. P. 588. ගම—කැඳෑකෝරලේ තාමර හම්මිල්ලෑව. | | | | |
| 4G | තාමරහම්මිල්ලෑව | .. තාමරහම්මිල්ලෑවේ ඩී. කේ. ඇම්. සී. ජිනපාල .. | .. කැලේ | .. 4 2 22 | 19 |
| 4H | එම .. | එම .. | .. එම | .. 1 1 28 | 19 |
| | සිතියම F. V. P. 528. ගම—කැඳෑකෝරලේ තම්මන්නා අලවක. | | | | |
| 1J | තම්මන්නාඅලවකකැලේ | .. ඒ. එච්. පුන්චිරාල .. | .. වත්තට සුදුසු හේන | 0 2 19 | 17 |
| 1K | එම .. | එම .. | .. එම | .. 0 1 23 | 17 |
| 1L | එම .. | එම .. | .. එම | .. 0 0 11 | 17 |
| 20B | ඇල .. | එම .. | .. වියලිඇල | .. 0 0 9 | 17 |

* මෙම ඉඩමට යම්කාලයකදී ආණ්ඩුව විසින් නියමකරන බදුගෙවන්ට ඕනෑය. දැනට කලාවැව යෝදයාඇල යටතේ තිබෙන ඉඩම්වල බද්දට වඩා වැඩිකරන්නේ නැත කියා ආණ්ඩුව පොරොන්දු නොවේ. දැනට එම ඉඩම අවුරුද්දට අක්කරයකට රු. 2ක බද්දට යටත්ය. මාස් කන්නට පමණක් වතුර දෙනු ලැබේ.

මෙම සියලුම ඉඩම් වරක් විකිනීමට ප්‍රසිද්ධකරණලදී. නුමුත් ගැනුම්කාරයෝ විකිනීමේ කොන්දේසි සම්පූර්ණ නොකල නිසා නැවතත් විකිනීමට ප්‍රසිද්ධකරනලදී.

මෙම බිම්කට්ටි ගැන වැඩිදුර කාරනා උතුරු මධ්‍යම දිසාවේ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේගෙන්ද, ඒවායේ සිතියම් සර්වේයර් ජනරල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිය.

වර්‍ෂ 1919ක්වූ සැප්තැම්බර් මස 15වෙනි දින කොළඹ මහලේකම්තාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

ඒ. ඇස්. පැග්ඩන්,
වැඩබලන මහලේකම්තාරිස් වෙනුව.

**No. 1,374, P. of U.**—ඌව දිසාවේ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වර්ෂ 1919ක්වූ නොවැම්බර් මස 28වෙනි දිනවූ සිකුරාදා දවල් 12ට බදුළු කච්චේරියේදී වෙන්දේසිකර විකුණන්ට යෙදෙනවා ඇත. ඌව දිසාවේ බදුළු දිස්ත්‍රික්කේ බුත්තල කොටසගේ පිහිටා තිබෙන බිම් කැබලි 1ක්.

සිතියම 1,902. ගම—බුත්තල පලාතේ බුත්තලකෝරලේ ඔක්කම්පිටියේගම. අයිතිකමකියන්නා—ආණ්ඩුව.

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා. | අන්දම. | මහත, අ. | රූ. | ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|---|---|
| 14 | වනේහේන | .. උක්කම්පිටියේ බී. ඇම්. ගම්මන්ඩි | .. හේන | .. 3 | 1 | 2 | 15* |

* මෙම ඉඩම විකුණනු ලබන්නේ මෙහි පහත පෙණෙන කොන්දේසි පිටය.

(*a*) මෙම ඉඩමේ වටිනාකම ගැනුම්කාරයා විසින් අවුරුදුපතා 10 අවුරුද්දක් ඇතුළතදී ගෙවිය යුතුයි.

(*b*) මෙම ඉඩම ගැනුම්කාරයා විසින් දියබද්ද අවුරුද්දකට අක්කරයකට රුපියල් 2ක බැගින් ගෙවිය යුතුයි. මෙම දියබද්ද වර්ෂ 1924රේ අවුරුද්දේද ඊට පසු සෑම අවුරුදු 5හෙන් 5හට වැඩිකරනු ලැබේ. එම වැඩිකරන මුදල ප්‍රථමයෙන් ගෙවූ මුදලෙන් බාගයකට නොවැඩිවේ.

මෙම ඉඩම ගැණ වැඩිදුර කාරණ ඌව දිසාවේ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේගෙන්ද, ඒකේ සිතියම සර්වෙයර් ජනරාල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිය.

වර්ෂ 1919ක්වූ ඔක්තෝබර් මස 15වෙනි දින කොළඹ
මහලේකම්තාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

ඒ. ඇස්. පැග්ඩන්,
වැඩබලන මහලේකම්තාරිස් වම්හ.

---

**No. 1,375, P. of U.**—ඌව දිසාවේ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වර්ෂ 1919ක්වූ නොවැම්බර් මස 28වෙනි දිනවූ සිකුරාදා දවල් 12ට බදුළු කච්චේරියේදී වෙන්දේසිකර විකුණන්ට යෙදෙනවා ඇත. ඌව දිසාවේ බදුළු දිස්ත්‍රික්කේ බුත්තල, උඩුකිඳ, බින්තැන්න වෙල්ලස්ස සහ වියළුව කොට්ඨාශවල පිහිටා තිබෙන බිම්කැබලි 28ක්.

| නො. | ඉඩමේ නම | ඉල්ලුම්කාරයා. | අන්දම. | මහත, අ. | රූ. | ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|---|---|
| | සිතියම 224. ගම—බුත්තල කඳුකරකෝරලේ මාසිපොතේ. අයිතිකමකියන්නා—ආණ්ඩුව. | | | | | | |
| 5F | හෝම්පොලගොඩපතන නොහොත් හෝම්පොලපතන | — | .. පතන, ගම්සොහොන්බූමියටඉතුරුකර තිබේ. විකිනීමට නොවේ | .. 0 | 2 | 17 | —* |
| | සිතියම 2,039. ගම—උඩුකිඳ උඩපලාත කෝරලේ මුදුන්පිටගම. | | | | | | |
| 1 | මැඳගින්නපතන .. | — .. | .. හේන, ගම්සභාපාරට ඉතුරුකරතිබේ. විකිනීමට නොවේ | .. 0 | 0 | 5 | —* |
| 2 | එම .. | අළුත්තැන්නේ අප්පුහාමි | .. හේන, එලිකර එලවළු වවාතිබේ | .. 0 | 2 | 27 | 40 |
| 3 | එම .. | එම .. | .. පතන, වල්පැලැටිතිබේ | .. 0 | 1 | 11 | 40 |
| | සිතියම 2,044. බින්තැන්නේ අරළුපිටිකෝරලේ ගල්බොක්ක. | | | | | | |
| 1 | කුඹුක්ගොල්ල නොහොත් කුඹුක්ගොල්ලෙල්කැලේ | — .. | .. ලොකුකැලෑව, මිල්ල, මොර දුනුමඩල සහ බිරිය ගස්තිබේ, ඔයට ඉතුරුකර තිබේ. විකිනීමටනොවේ. | .. 1 | 3 | 16 | —* |
| 2 | එම .. | — .. | .. එම .. | .. 0 | 3 | 23 | —* |
| 3 | එම .. | — .. | .. ලොකුකැලෑව, ගම්සභාප රට ඉතුරුකර තිබේ. විකිනීමටනොවේ | .. 0 | 0 | 12 | —* |
| 4 | එම | .. පෙතියාගොඩ ඒ. ඇම්. කුරුසාමි | .. ලොකුකැලෑව, වටිනාගස්තිබේ, මිල්ල, මොර, දුනුමඩල සහ බිරිය | .. 0 | 3 | 26 | 65 |
| 5 | එම .. | එම | .. එම .. | .. 0 | 2 | 31 | 65 |
| | සිතියම 2,045. ගම—බින්තැන්නේ අරළුපිටිකෝරලේ පැතියාගොඩ. | | | | | | |
| 1 | හෙලඅත්වනාහේන .. | — .. | .. හේන, මැටිගසපු ගෙයකින් කැල්ලක් තිබේ, කරත්තපාරට ඉතුරුකරතිබේ. විකිනීමට නොවේ.. | .. 0 | 0 | 29 | —* |
| 2 | හෙලඅත්වාන සහ හෙලඅත්වාන කැලේ | — .. | .. දෙනිය සහ කැලෑව පාරට ඉතුරුකර තිබේ. විකිනීමටනොවේ | .. 0 | 0 | 11 | —* |
| 3 | හෙලඅත්වානහේනනොහොත්ඇත් වතේ කැලේ | පෙතියාගොඩ ඇම්. හෙන්ද්‍රික් | ඔයස් එලිකරපු හේන, මැටිගසපු ගෙයක් තිබේ .. | .. 0 | 1 | 34 | 30† |
| 4 | එම .. | එම .. | .. දෙනිය .. | .. 1 | 0 | 1 | 75 |
| 5 | අත්වාන .. | එම .. | .. හේන, බතල සහ කෙසෙල් වවාතිබේ | 0 | 1 | 2 | 60 |
| | සිතියම 1,995. ගම—වෙල්ලස්ස වැගම්පත්තුකෝරලේ කරගහවෙල. අයිතිකමකියන්නා—මල්හැවේ සලමන්අප්පු. | | | | | | |
| 1 | දෙහිගහලහන් හෙලවත්ත නො හොත් වලකොලහේන | ආර්. පී. බී. ජේම්ස්අප්පුහාමි | බිබිලේ අත්හැරපුවත්ත, කොස්ගස් 1ක්ද, අඹ ගස් 4ක්ද, දෙබමිගස් 6ක්ද තිබේ, මෙවාටඅවුරුදු 20ක්පමණගතවතිබේ | 4 | 0 | 7 | 30‡ |
| | අන්තිම සිතියම 192. ගම—උඩුකිඳ අඹවිනිපලාතකෝරලේ උඩකැන්දගොල්ල. අයිතිකමකියන්නා—ආණ්ඩුව. | | | | | | |
| 1c | කම්බොක්කඅගලේහේන | .. නායබූන්නේගෙදර හිරව් | .. හේන .. | .. 0 | 2 | 2 | 35 |
| | සිතියම 1,902. /ගම—බුත්තල බුත්තලකෝරලේ ඔක්කම්පිටිය. අයිතිකමකියන්නා—ආණ්ඩුවේ ඉඩම, ඔක්කම්පිටියේ සුදුබන්ඩා විසින් අල්ලාගෙනතිබේ. | | | | | | |
| 6 | පත්ලන්දේශාය නොහොත්වලව්වේ වත්ත | — .. | .. හේන, ගෙයක්ද, අිරවැටිච්ච ගෙයක්ද තිබේ .. | .. 0 | 1 | 36 | 20‡ |
| | බී. ඇස්. පී. පී. සිතියමේ නොම්මරය 70. ගම—උඩුකිඳ අඹවිනිපලාතකෝරලේ කරගස්තැන්න. අයිතිකමකියන්නා—ආණ්ඩුව. | | | | | | |
| 2I | ගල්ගොඩෙල්ලපොත | .. ලාවන්නා නුර් මහම්මදු | .. දෙනිය .. | .. 1 | 0 | 4 | 30 |
| 2J | එම | — .. | .. දෙනිය, සියින් කැලෑව, කඳුරටඉතුරුකර තිබේ. විකිනීමට නොවේ | .. 0 | 0 | 14 | \|* |
| | සිතියම 2,043. ගම—වියළුව ඔයපලාතකෝරලේ උඩඇල්ලගම. අයිතිකමකියන්නා—ආණ්ඩුවේඉඩම, කළුගහ පුරේ හිංගිරිහාමි විසින් අල්ලාගෙනතිබේ. | | | | | | |
| 1 | කරඳේගාවාවත්ත නොහොත් කරඳේගාවාවත්තේහේන | — .. | .. හේන, අවුරුදු 2ක් වයස්වූ කෙසෙල් ගස්තිබේ .. | .. 0 | 2 | 5 | 20 |
| | අයිතිකමකියන්නා—ආණ්ඩුව. | | | | | | |
| 2 | කරඳේගාවාවත්තේහේන .. | — .. | .. කැලෑව සහ පාර පාරටඉතුරුකරතිබේ. විකිනීමට නොවේ... | .. 0 | 0 | 16 | —* |

| අංක. | ඉඩමේ නම. | ඉල්ලම්කාරයා. | අන්දම. | මහත, අ. රූ. ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|
| 3 | කරදෙගාවාවත්තේහේන | සී. සී. රඹුක්පොත ඔයපලාතකෝරල | කැලෑව සහ හේන | 0 3 3 | 30 |
| 4 | එම | එම | එම | 2 1 5 | 25 |
| 5 | එම | — | කැලෑව, හේන සහ ඇල, ඇලටඉතුරු කරතිබේ. විකිනීමට නොවේ | 0 1 6 | —* |
| 6 | එම | සී. සී. රඹුක්පොත ඔයපලාතකෝරල | කැලෑව | 0 2 22 | 25§ |
| 7 | එම | — | කැලෑව සහ පාර පාරටඉතුරුකරතිබේ. විකිනීමටනොවේ | 0 0 5 | —* |
| 8 | එම | සී. සී. රඹුක්පොත ඔයපලාතකෝරල | කැලෑව | 0 0 33 | 20 |
| | අයිතිකමකියන්නා—ආණ්ඩුවේ ඉඩම, හෙල්ලිවත්තේගෙදර තිසාහාමි විසින් අල්ලාගෙනතිබේ | | | | |
| 9 | දිඹුලගාවාකුඹුර | — | කුඹුර | 0 0 10 | 100 |

* නොවිකුණ ඉතුරුකරනුලැබේ.

† මෙම ඉඩම් විකුණනුලබන්නේ ඉල්ලම්කාරයා ඇර වෙන යම් කෙනෙක් වෙන්දේසියෙන් ගත්තොත් ඉල්ලම්කාරයාට රුපියල් 100ක් ගෙවියයුතු කොන්දේසිය පිටයි.

‡ දෙවෙනි වතාවට ප්‍රසිඩකලා ඇත.

§ මෙම ඉඩම මැදින් කුඹුරුවලට යාම පිණිස ප්‍රසිඩ පාරක් වශයෙන් පාරකට ඉඩහරින පොරොන්දුවකට යටත්කරනලද කොන්දේසිය පිට මේ බිම්කට්ටිය විකුණනු ලැබේ.

මෙම ඉඩම් ගැණ වැඩිදුර කාරනා ඌව දිසාවේ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේගෙන්ද, ඒවායේ සිතියම් සර්වෙයර් ජනරල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිය.

වර්ෂ 1919ක්වූ ඔක්තෝබර් මස 15වෙනි දින කොළඹ මහලේකම්තාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

ඒ. ඇස්. පැග්ඩන්,
වැඩබලන මහලේකම්තාරිස් වම්භ.

---

**No. 5,292, S. O.**—ඉඩම් බේරුම්කරණ කොමසාරිස් උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වර්ෂ 1919ක්වූ දෙසැම්බර් මස 4වෙනි දිනවූ බෘහස්පතින්ද පෙරවරු 9ට රඹුක්කන තානායමේදී වෙන්දේසිකර විකුණන්ට හෝ නිරවුල්කරදෙන්ට යෙදෙනවා ඇත. සබරගමු දිසාවේ කෑගල්ල පලාතේ කිනිගොඩ කෝරලේ කොටිඨාසයේ පිහිටා තිබෙන බිම්කැබලි 3ක්.

ලංකාමැනීමේ සිතියම 162.—ගොඩගන්දෙනිය.

| නො. | ඉඩමේ නම. | අයිතිකමකියන්නා. | අන්දම. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 53 | බෝගහලන්දේවත්ත | ආණ්ඩුව | හේන | 3 2 13 |
| 53A | එම | එම | එම | 0 0 38 |
| 52 | බෝගහලන්දේවත්තහේන | එම | එම | 1 3 25* |

* බදුදීමට පමණයි.

අක්කරයක තක්සේරු මිල රුපියල් 15 සිට 50 දක්වාය.

මෙම ඉඩම් ගැන වැඩිදුර තොරතුරු ඉඩම් බේරුම්කරන කොමසාරිස් උන්නාන්සේගෙන්ද, ඒවායේ සිතියම් සර්වෙයර් ජනරල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිය.

වර්ෂ 1919ක්වූ ඔක්තෝබර් මස 15වෙනි දින කොළඹ මහලේකම්තාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

ඒ. ඇස්. පැග්ඩන්,
වැඩබලන මහලේකම්තාරිස් වම්භ.

---

**No. 5,293, S. O.**—ඉඩම් බේරුම්කරණ කොමසාරිස් උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වර්ෂ 1919ක්වූ නොවැම්බර් මස 29වෙනි දිනවූ සෙනසුරාදා දවල් 12ට තලගල්ඔයේ කුඩාරමේදී වෙන්දේසිකර විකුනන්ට හෝ නිරවුල්කරදෙන්ට යෙදෙනවා ඇත. සබරගමු දිසාවේ කෑගල්ල පලාතේ ගල්බඩ කෝරලේ කොටිඨාසයේ පිහිටා තිබෙන බිම්කැබලි 9ක්.

ලංකාමැනීමේ සිතියම 166.—එරගල්ල.

| නො. | ඉඩමේ නම | අයිතිකමකියන්නා. | අන්දම. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 41 | මඩපොලේහේන | ආණ්ඩුව | හේන | 0 3 39 |
| 42 | දන්ගොල්ලේහේන | එම | එම | 0 3 2 |
| 43 | කිරිදිගලේහේන | එම | එම | 0 3 4 |
| 44 | එම | එම | එම | 1 1 33 |
| 45 | නාබිරික්කේහේන | එම | එම | 1 0 38 |
| 46 | අමුකනත්තේපොල්කොටුවේහේන | එම | එම | 2 1 2 |
| 48 | කිරිදිගලහේන | එම | එම | 3 1 10 |
| 49 | අමුකනත්තේදෙනිමුල්ලේහේන | එම | එම | 1 0 3 |
| 60 | නත්තලගොඩවත්ත | එම | එම | 2 0 2 |

අක්කරයක තක්සේරු මිල රුපියල් 15 සිට 50 දක්වාය.

මෙම ඉඩම් ගැන වැඩිදුර තොරතුරු ඉඩම් බේරුම්කරන කොමසාරිස් උන්නාන්සේගෙන්ද, ඒවායේ සිතියම් සර්වෙයර් ජනරල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිය.

වර්ෂ 1919ක්වූ ඔක්තෝබර් මස 15වෙනි දින කොළඹ මහලේකම්තාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

ඒ. ඇස්. පැග්ඩන්,
වැඩබලන මහලේකම්තාරිස් වම්භ.

---

**No. 5,294, S. O.**—ඉඩම් බේරුම්කරණ කොමසාරිස් උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වර්ෂ 1919ක්වූ නොවැම්බර් මස 29වෙනි දිනවූ සෙනසුරාදා දවල් 12ට තලගල්ඔයේ කුඩාරමේදී වෙන්දේසිකර විකුණන්ට හෝ නිරවුල්කරදෙන්ට යෙදෙනවා ඇත. සබරගමු දිසාවේ කෑගල්ල පලාතේ ගල්බඩ කෝරලේ කොටඨාසයේ පිහිටාතිබෙන බිම්කැබලි 1ක්.

ලංකාමැනීමේ සිතියම 165. ගම—කඩිගමුව.

| නො. | ඉඩමේ නම. | අයිතිකමකියන්නා. | අන්දම. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 249 | මල්වතුගොඩහේන | රදුශ්‍යේවත්තේ පදිංචි පුංචිරාල | හේන | 1 0 4 |

අක්කරයක තක්සේරු මිල රුපියල් 15 සිට රුපියල් 50 දක්වාය.

මෙම ඉඩම ගැණ වැඩිදුර තොරතුරු ඉඩම් බේරුම්කරණ කොමසාරිස් උන්නාන්සේගෙන්ද, ඒකේ සිතියම සර්වෙයර් ජනරල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිය.

වර්ෂ 1919ක්වූ ඔක්තෝබර් මස 15වෙනි දින කොළඹ මහලේකම්තාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

ඒ. ඇස්. පැග්ඩන්,
වැඩබලන මහලේකම්තාරිස් වම්භ.

**No. 5,295, S. O.**—ඉඩම් බේරුම්කරණ කොමසාරිස් උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වර්‍ෂ 1919ක්වූ නොවැම්බර් මස 29වෙනි දිනවූ සෙනසුරාදා දවල් 12ට තලගල්ඔයේ කුඩාර මෙදී වෙන්දේසිකර විකුණන්ට හෝ නිරවුල්කරදෙන්ට යෙදෙනවා ඇත. සබරගමු දිසාවේ කෑගල්ල පලාතේ ගල්බඩ කෝරලේ කොඨාසයේ පිහිටාතිබෙන බිම්කැබලි 2ක්.

ලංකාමැනීමේ සිතියම 178. ගම—මාකෙහෙල්වල.

| නො. | ඉඩමේ නම. | | අයිතිකමකියන්නා. | | අන්දම. | | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|---|---|---|
| 191 | කපුකොටුව | .. | ආණ්ඩුව | .. | මූකලාන | .. | 0 3 0 |
| 192 | කපුකොටුවහේන | .. | සුරියපෙරුම ආරච්චිලගේ සියාතු | .. | හේන | .. | 0 1 28 |

අක්කරයක තක්සේරු මිල රුපියල් 15 සිට රුපියල් 50 දක්වාය.

මෙම ඉඩම් ගැණ වැඩිදුර තොරතුරු ඉඩම් බේරුම්කරණ කොමසාරිස් උන්නාන්සේගෙන්ද, ඒවායේ සිතියම් සර්වේයර් ජනරල් උන්නාන්සේගෙන්ද දැනගත හැකිය.

වර්‍ෂ 1919ක්වූ ඔක්තෝබර් මස 15වෙනි දින කොළඹ
මහලේකම්තාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය

ඒ. ඇස්. පැග්ඩන්,
වැඩබලන මහලේකම්තාරිස් වම්හ.

---

**No. 5,296, S. O.**—ඉඩම් බේරුම්කරණ කොමසාරිස් උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වර්‍ෂ 1919ක්වූ නොවැම්බර් මස 29වෙනි දිනවූ සෙනසුරාදා දවල් 12ට තලගල්ඔයේ කුඩාර මෙදී වෙන්දේසිකර විකුණන්ට හෝ නිරවුල්කරදෙන්ට යෙදෙනවා ඇත. සබරගමු දිසාවේ කෑගල්ල පලාතේ ගල්බොඩ කෝරලේ කොඨාසයේ පිහිටා තිබෙන බිම්කැබලි 2ක්.

ලංකාමැනීමේ සිතියම 167. ගම—යට්වල්දෙනිය.

| නො. | ඉඩමේ නම. | | අයිතිකමකියන්නා. | | අන්දම. | | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|---|---|---|
| 14 | ගල්ගොඩවත්ත | .. | වත්තේවෙදගේ පිකිරිඅප්පු | .. | වත්ත | .. | 0 3 31 |
| 71 | කුඩුපොලතැන්නේවත්ත | .. | මැදගලදෙනියේ පදිංචි වත්තේවෙදගේහාමි | .. | එම | .. | 1 0 20 |

අක්කරයක තක්සේරු මිල රුපියල් 15 සිට රුපියල් 50 දක්වාය.

මෙම ඉඩම් ගැණ වැඩිදුර තොරතුරු ඉඩම් බේරුම්කරණ කොමසාරිස් උන්නාන්සේගෙන්ද, ඒවායේ සිතියම් සර්වේයර් ජනරල් උන්නාන්සේගෙන්ද දැනගත හැකිය.

වර්‍ෂ 1919ක්වූ ඔක්තෝබර් මස 15වෙනි දින කොළඹ
මහලේකම්තාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

ඒ. ඇස්. පැග්ඩන්,
වැඩබලන මහලේකම්තාරිස් වම්හ.

---

## ආණ්ඩුවට ඉඩම් ලබාගැණීම සම්බන්ධ දැන්වීම.

වර්‍ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්මර 3නේ ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට ආණ්ඩුවේ කටයුත්තකට, එනම්:—වැල්ලේ දුම්රියපාර සෑදීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම් ලබාගැණීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්‍ෂ 1876යේ ඉඩම් ලබාගැණීමේ ආඥාපත්‍රයේ" හවෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට කාරක මන්ත්‍රිසභාවේ මන්ත්‍රණය ඇතුව උතුමාණන්වහන්සේගෙන් නිසිආකාර මට අණලැබී තිබේ, ඒ ඉඩම්නම්:—

සිතියම 17,041. ගම—වේරගොඩ.

| නො. | ඉඩමේ නම. | | අන්දම. | | අයිතිකමකියන්නා. | | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|---|---|---|
| 1 | වේරගොඩ | .. | තණකොල බිම | .. | සී. ඒ. තලේරත්න | .. | 0 2 15·83 |
| 2 | වදුල්ලෙවත්ත | .. | එම | .. | ජෝන් පීරිස් | .. | 0 0 25·81 |
| 3 | එම | .. | එම | .. | ඇන්. ඒ. පෙරේරා | .. | 0 0 0·50 |

එබැවින් ඉඩම් අයිතිකරගැණීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදු ජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩම්වලට අයිතිවාසිකම් ඇත්තාවූ සෑමදෙනම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්‍ෂ 1919ක්වූ නොවැම්බර් මස 17වෙනි දින උදේ 11.30යේ කනිසමට මෙම කන්තෝරුවේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම් වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඒට ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

වර්‍ෂ 1919ක්වූ ඔක්තෝබර් මස 14වෙනි
දින කොළඹ කච්චේරියේදීය,

ජේ. ජී. ෆ්‍රේසර්,
ආණ්ඩුවේ ඒජන්ත වම්හ.

---

වර්‍ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්මර 3නේ ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට, ආණ්ඩුවේ කටයුත්තකට ඒනම්:—ගල්කිස්සේ ප්‍රසිඩ් කන්කුස්සියක් සෑදීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම ලබාගැණීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්‍ෂ 1876යේ ඉඩම් ලබාගැණීමේ ආඥාපත්‍රයේ" හවෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට කාරක මන්ත්‍රිසභාවේ මන්ත්‍රණය ඇතුව උතුමාණන්වහන්සේගෙන් නිසිආකාර මට අණලැබී තිබේ, ඒ ඉඩමනම්:—

සිතියම 17,026. ගම—ගල්කිස්ස.

| නො. | ඉඩමේ නම. | | අන්දම. | | අයිතිකමකියන්නා. | | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|---|---|---|
| 1 | ගල්කිස්සවත්ත | .. | පොල්ගස් 42ක් තිබේ | .. | ඊ. ඇල්. ඇප්. ද සොයිසා මහත්මයා | .. | 0 1 4·19 |

එබැවින් ඉඩම් අයිතිකරගැණීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩමට අයිතිවාසිකම් ඇත්තාවූ සෑමදෙනම් තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්‍ෂ 1919ක්වූ නොවැම්බර් මස 17වෙනි දින දවල් 12යේ කනිසමට මෙම කන්තෝරුවේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඒට ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑබව මෙයින් දැනගත යුතුයි.

වර්‍ෂ 1919ක්වූ ඔක්තෝබර් මස 14වෙනි
දින කොළඹ කච්චේරියේදීය.

ජේ. ජී. ෆ්‍රේසර්,
ආණ්ඩුවේ ඒජන්ත වම්හ.

වර්‍ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්මර 3නේ ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට ආණ්ඩුවේ කටයුත්තකට, ඒනම්:—හිරිපිටියේ මහමදගම්කාරයින්ට සොහොන්භූමියක් පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම් ලබාගැණීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්‍ෂ 1876යේ ඉඩම් ලබාගැණීමේ ආඥාපත්‍රයේ" හවෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට කාරක මන්ත්‍රිසභාවේ මන්ත්‍රණය ඇතුව උතුමාණන්වහන්සේගෙන් නිසිආකාර මට අණලැබී තිබේ, ඒ ඉඩම්නම්:—

සිතියම 17,016. ගම—හිරිපිටිය.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකමකියන්නා. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | මිල්ලෙගහලන්ද | .. එලිකරපු බිම | .. වික්‍රමපේඩිගේ බබියා සහ තව අය | .. 0 3 06·6 |
| 2 | කැටකැලේගහවත්ත | .. පොල් වගාව | .. වික්‍රමපේඩිගේ බජුවා සහ තව අය | .. 0 0 35 |
| 3 | මිල්ලෙගහලන්ද | .. එලිකරපු බිම | .. වික්‍රමපේඩිගේ බබියා සහ තව අය | .. 0 0 03·7 |
| 4 | එම | .. පොල් වගාව | .. වික්‍රමපේඩිගේ බජුවා සහ තව අය | .. 0 0 10·1 |

එබැවින් ඉඩම අයිතිකරගැණීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඔනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩම්වලට අයිතිවාසිකම් ඇත්තාවූ සෑමදෙනම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්‍ෂ 1919ක්වූ නොවැම්බර් මස 17වෙනි දින දවල් 12.30හේ කනිසමට මෙම කන්තෝරුවේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයිඅන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඔනෑවා සහ මෙම ඉඩම වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඊට ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඔනෑබව මෙයින් දැනගත යුතුයි.

වර්‍ෂ 1919ක්වූ ඔක්තෝබර් මස 14වෙනි
දින කොළඹ කච්චේරියේදීය.

ජේ. ජී. ෆ්‍රේසර්,
ආණ්ඩුවේ ඒජන්ත වර්‍ගය.

---

වර්‍ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්මර 3නේ ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට ආණ්ඩුවේ කටයුත්තකට. ඒනම්:—පැපිලියාවල පිරිමිලමයින්ගේ සෙකෝලයට පාරක් සෑදීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම ලබාගැණීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්‍ෂ 1876යේ ඉඩම් ලබාගැණීමේ ආඥාපත්‍රයේ" හවෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට කාරක මන්ත්‍රිසභාවේ මන්ත්‍රණය ඇතුව උතුමාණන්වහන්සේගෙන් නිසිආකාර මට අණලැබී තිබේ, ඒ ඉඩමනම්:—

සිතියමේ නො. 4. ගම—ඕවිටිගම.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකමකියන්නා. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 4 | ඉඹුලහේන | .. පොල්වගාව | .. ඇම්. දෙන් හෙන්දිරික් | .. 0 0 9 . |

එබැවින් ඉඩම අයිතිකරගැණීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදු ජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඔනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩමට අයිතිවාසිකම් ඇත්තාවූ සෑමදෙනම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්‍ෂ 1919ක්වූ නොවැම්බර් මස 17වෙනි දින දවල් 1ටක් කනිසමට මෙම කන්තෝරුවේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඔනෑවා සහ මෙම ඉඩම වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඊට ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඔනෑබව මෙයින් දැනගත යුතුයි.

වර්‍ෂ 1919ක්වූ ඔක්තෝබර් මස 14වෙනි
දින කොළඹ කච්චේරියේදීය.

ජේ. ජී. ෆ්‍රේසර්,
ආණ්ඩුවේ ඒජන්ත වර්‍ගය.

---

වර්‍ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්මර 3නේ ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට ආණ්ඩුවේ කටයුත්තකට, එනම්:—නාවලපිටියේ අසූචි දැමීමට ස්ථානයක් සාදන පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම ලබාගැනීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්‍ෂ 1876යේ ඉඩම් ලබාගැනීමේ ආඥාපත්‍රයේ" හවෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට කාරක මන්ත්‍රිසභාවේ මන්ත්‍රණය ඇතුව උතුමාණන්වහන්සේගෙන් නිසිආකාර මට අණලැබී තිබේ, ඒ ඉඩමනම්:—

සිතියම 6,984. ගම—බව්වාගම.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකමකියන්නා. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | ගෙන්ගෙදරවත්ත | .. තේ සහ අප්‍රසිද්ධ මාවත | .. තලවාකැලේ සිවසාමි කන්කානි | .. 1 0 0·4 |

එබැවින් ඉඩම අයිතිකරගැණීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඔනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩමට අයිතිවාසිකම් ඇත්තාවූ සෑමදෙනම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්‍ෂ 1919ක්වූ නොවැම්බර් මස 18වෙනි දින දවල් 12හේ කනිසමට නාවලපිටියේ ලෝකල්බෝඩ් කන්තෝරුවේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයිඅන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඔනෑවා සහ මෙම ඉඩම වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඊට ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඔනෑ බව මෙයින් දැනගත යුතුයි.

වර්‍ෂ 1919ක්වූ ඔක්තෝබර් මස 17වෙනි
දින මහනුවර කච්චේරියේදීය.

සී. ඇස්. වෝගන්,
ආණ්ඩුවේ ඒජන්ත වර්‍ගය.

---

වර්‍ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්මර 3නේ ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට, ආණ්ඩුවේ කටයුත්තකට, ඒනම්:—පාඨශාලාවක් ගොඩනැගීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම ලබාගැණීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්‍ෂ 1876යේ ඉඩම් ලබාගැණීමේ ආඥාපත්‍රයේ" හවෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට කාරක මන්ත්‍රිසභාවේ මන්ත්‍රණය ඇතුව උතුමාණන්වහන්සේගෙන් නිසිආකාර මට අණලැබී තිබේ, ඒ ඉඩමනම්:—

සිතියම 127. ගම—ගොම්බද්දල.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකමකියන්නා. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 24 | මැදගොඩ | .. හේන | .. ගොම්බද්දල පදිංචි ලියනගේ සියෙඩු සහ තවත් අය | .. 0 2 10 |

එබැවින් ඉඩම අයිතිකරගැණීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙනබව පොදුජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඔනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩමට අයිතිවාසිකම් ඇත්තාවූ සෑමදෙනම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්‍ෂ 1919ක්වූ නොවැම්බර් මස 20වෙනි දින උදේ 11 කනිසමට කඹුරුපිටියේ තානායමේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඊට ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑබව මෙයින් දැනගත යුතුයි.

වර්‍ෂ 1919ක්වූ ඔක්තෝබර් මස 8වෙනි
දින මාතර කච්චේරියේදීය.

ජේ. ඞී. බ්‍රවුන්,
ආණ්ඩුවේ උප ඒජන්ත වර්‍ගය.

---

වර්‍ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්මර 3නේ ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට ආණ්ඩුවේ කටයුත්තකට, ඒනම් :—දෙවුන්දර පහන්ගේ සම්බන්ධව මෙහි පහත සඳහන්වෙන ඉඩම ලබාගැණීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්‍ෂ 1876යේ ඉඩම් ලබාගැණීමේ ආඥාපත්‍රයේ" හවෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට කාරක මන්ත්‍රිසභාවේ මන්ත්‍රණය ඇතුව උතුමාණන්වහන්සේගෙන් නිසිආකාර මට අණලැබී තිබේ, ඒ ඉඩමනම් :—

සිතියම 11,264. ගම—දෙවුන්දර.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකමකියන්නා. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | උපාසකයාගේවත්ත .. | — | .. දෙවුන්දර පදිංචි ජී. ඇම්. ජයසිංහ සහ තවත් අය .. | 0 0 4·15 |

එබැවින් ඉඩම අයිතිකරගැණීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩමට අයිතිවාසිකම් ඇත්තාවූ සෑමදෙනම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්‍ෂ 1919ක්වූ නොවැම්බර් මස 24වෙනි දින උදේ 10යේ කනිසමට මාතර කච්චේරියේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඊට ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑබව මෙයින් දැනගත යුතුයි.

වර්‍ෂ 1919ක්වූ ඔක්තෝම්බර් මස 8වෙනි
දින මාතර කච්චේරියේදීය.

ජේ. ඞී. බ්‍රවුන්,
ආණ්ඩුවේ උපඒජන්ත වර්‍ගය.

---

වර්‍ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්මර 3නේ ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට ආණ්ඩුවේ කටයුත්තකට, එනම් :—කොලොඹුගම ස්වභාෂා පිරිමි පාඨශාලාවට ගැනීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම ලබාගැනීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්‍ෂ 1876යේ ඉඩම් ලබාගැණීමේ ආඥාපත්‍රයේ" හවෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට කාරක මන්ත්‍රිසභාවේ මන්ත්‍රණය ඇතුව උතුමාණන්වහන්සේගෙන් නිසිආකාර මට අණලැබී තිබේ, ඒ ඉඩමනම් :—

සිතියමේ නො. 2,779. ගම—කොලොඹුගම නවදුම්කෝරලේ.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකමකියන්නා. | මහත, අ රූ. ප. |
|---|---|---|---|---|
| 3 | බඹහැලගේවත්ත .. | ලන්ද | .. ගොඩකන්කානන්ගේ දෙන් බස්තියන් අප්පුහාමි සහ තවත් අය .. | 0 0 14·2 |

එබැවින් ඉඩම අයිතිකරගැණීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩමට අයිතිවාසිකම් ඇත්තාවූ සෑමදෙනම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්‍ෂ 1919ක්වූ නොවැම්බර් මස 14වෙනි දින පස්වරූ 1යේ කනිසමට රත්නපුර කච්චේරියේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඊට ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියා සිටින්ට ඕනෑබව මෙයින් දැනගත යුතුයි.

වර්‍ෂ 1919ක්වූ ඔක්තෝබර් මස 11වෙනි
දින රත්නපුරේ කච්චේරියේදීය.

ඒ. බී. ඇලැක්සැන්ඩර්,
ආණ්ඩුවේ ඒජන්ත වර්‍ගය.

---

## ඉල්ලුම්පත්‍ර සඳහා කරණලද දැන්වීම.

1920වෙනි අවුරුද්දේ මාදම්පේ සැනිටර් බෝඞ් සීමාවතුළ තිබෙන පාරවල් පිහදැමීමේ සහ කුණු අහක්කෙරීමේ කොන්ත්‍රාත්එක.

1. මාදම්පේ නගරයේ මෙහි පහත සඳහන් පාරවල් පිස දමා කුණු අහක්කිරීම ගැන සීල්කරපු ටැන්ඩර්ස් නොහොත් ඉල්ලුම්පත්‍ර නොවැම්බු මස 22වෙනි සෙනසුරාදා දවල් 2 වෙන තුරු පුත්තලමේ කච්චේරියේ මාදම්පේ සැනිටරි බෝඞ් සභාපතිතැන විසින් බාරගන්නවා ඇත.

පරන නගරය.

(1) මහවීතිය නොම්මර $\frac{3}{4}$සි
(2) කුරුනෑගලපාර නොම්මර $\frac{1}{2}$සි
(3) කඩවීපිය නොම්මර $\frac{1}{4}$සි
(4) පව්වියගමපාර නොම්මර $\frac{7}{8}$සි
(5) දූරගමපාර නොම්මර $\frac{5}{8}$සි
(6) මහමද්දේගමපාර නොම්මර $\frac{1}{2}$සි
(7) මැල්ලවගාරපාර නොම්මර $\frac{1}{4}$සි

අළුත් නගරය.

(8) මහවීදිය (කුරුනෑගලපාර) නොම්මර $1\frac{1}{2}$සි
(9) එගොඩයාගමපාර නොම්මර $\frac{1}{8}$සි
(10) කරුක්කුවපාර නොම්මර $\frac{1}{2}$සි
(11) සෙම්බුකට්ටියේපාර නොම්මර $\frac{1}{16}$සි
(12) කඩවීතිය නොම්මර $\frac{1}{4}$සි
(13) සියඹලගහමන්කඩපාර නොම්මර $\frac{1}{8}$සි
(14) බෝගහහරස්පාර නොම්මර $\frac{1}{16}$සි

2. ඉල්ලුම්කාරයා ඔහුගේ ඉල්ලුම්පත්‍රයේ මුදල් දෙකක් ඉල්ලා සිටින්ට ඕනෑය. (a) කුණු සහ අතුගාපු ආදියද ගෙන ගොස් සැනිටරි බෝඞ් සීමාවට පිටින් දමන්ට මුදලක්ද, (b) කුණු සහ අතුගාපු ආදිය බෝඞ් එක විසින් නියමකරන සැනිටරිබෝඞ් සීමාවපිට සිට සැතැක්ම බාගයක් ඇතුළ තිබෙන කුණු දමන ස්ථානයකට අරන් යෑමට මුදලක්ද.

3. 1920වෙනි වර්‍ෂය ඇතුළතදී මාදම්පේ නගරයේ පාරවල් අතුගෑමේ සහ කුණුඅහක්කෙරීමේ කොන්ත්‍රාත්එක ගැන ඉල්ලුම්පත්‍රය යන වචන ඉල්ලුම්පත්‍රවල්වල පිට ලියන්ට ඕනෑය.

එම ඉල්ලුම්පත්‍රය රුපියල් 5හක් සමග එවන්ටත් ඕනෑය.

4. ඒ සම්බන්ධ පාවිච්චිකරන්ට අදහස්කරන කුලීකාර සින්ගේ ගණන ඉල්ලුම්පත්‍රයෙහි ඉල්ලුම්කාරයා විසින් සඳහන් කරන්ට ඕනෑය.

බෝඩ්එක විසින් ගොන් දෙන්නෙක් බඳින බරකරත්ත දෙකක් සපයනවා ඇත.

හරක්ද, කරත්තකාරයෝද, කඹද. කරත්ත තෙල්ද, ඉරට ඉදල්ද කූඩාද, කොන්තරක්කාරයා විසින් සපයාගන්ට ඕනෑය.

කරත්ත කොන්තරක්කාරයා විසින් රෙපෙයාරුකරන්ටත් ඕනෑය.

5. තෝරගත් ඉල්ලුම්කාරයා ඔහුගේ ඉල්ලුම්පත්‍රයේ සඳහන්වෙන මුදලෙන් දහයෙන් පංගුවක් කාසිවලින් කොන්ත්‍රාත්එකේ වැඩකිරීම පිණිස ඇපදෙන්ට ඕනෑය. නොතාරිස් කෙනෙක් විසින් ලියනලද ඔප්පුවකට අත්සන්කරන්ට ඕනෑය. එම ඔප්පුවේ ගාස්තුද ඔහු විසින් දරාගන්ට ඕනෑය.

6. ඉතාම අඩු ඉල්ලීම නොහොත් වෙන කිසියම් ඉල්ලීමක් වත් බාරගැනීමට බෝඩ්එක බැඳී සිටින්නේ නැත.

7. වැඩිපුර කාරනා පුත්තලමේ කච්චේරියේ සැනිටරී බෝඩ් කන්තෝරුවෙන් දැනගන්ට පුලුවන.

අත්සන්කළේ, ඩබ්ලිව්. ඒ. වේට්,
සභාපතිතැන.

වර්‍ෂ 1919ක්වූ ඔක්තෝබර් මස 10වෙනි දින
පුත්තලමේ සැනිටරීබෝඩ් කන්තෝරුවේදීය.

---

වර්‍ෂ 1920සේ අවුරුද්දේ මාදම්පේ සැනිටරීබෝඩ් සීමාව තුළ තිබෙන කක්කුස්සි සුඩකිරීමේ කොන්ත්‍රාත් එකයි.

1920වෙනි අවුරුද්දේ මාදම්පේ සැනිටරී බෝඩ් සීමාවතුළ තිබෙන ප්‍රසිඩ කක්කුස්සි සුඩකිරීමේ කොන්ත්‍රාත්එක ගැන සීල්කරපු ටැන්ඩර්ස් නොහොත් ඉල්ලුම්පත්‍ර එම සැනිටරීබෝඩ් සභාපතිතැන විසින් පුත්තලමේ කච්චේරියේදී නොවැම්බර් මස 22වෙනි දින සෙනසුරාදා දවල් 2ක වෙනතුරු බාරගන්නවා ඇත.

(1) "1920වෙනි වර්‍ෂයට මාදම්පේ කක්කුස්සි සුඩකිරීමේ කොන්ත්‍රාත්එක ගැන ටැන්ඩරය නොහොත් ඉල්ලුම්පත්‍රය" යන වචන ටැන්ඩරය නොහොත් ඉල්ලුම්පත්‍රයේ පිට ලියන්ට ඕනෑය. එම ටැන්ඩරය රුපියල් 5ක් සමග එවන්ට ඕනෑය.

(2) ඉල්ලුම්කාරයා වැඩකරන්ට දැමීමට අදහස්කරන කුලීකාරසින්ගේ ගණන් ඉල්ලුම්පත්‍රයෙහි සඳහන්කරන්ට ඕනෑය. ගොන් දෙන්නෙක් බඳින කකුසිකරත්තයක් බෝඩ් එක විසින් සපයනු ලැබේ. ගොන්නුද කරත්ත කාරයෝද කරත්තේට ලන්තෑරුම්ද කුලීකාරසින්ට පනිච්චුද විෂ පහ කරන බෙහෙත්, කරත්තෙට ලනු සහ තෙල්ද, ඉරට ඉදල් සහ කොහු බත් නොහොත් කදන් කූඩුද කොන්ත්‍රාත්කාරයා විසින් සපයන්ට ඕනෑය.

(3) තෝරගත් ඉල්ලුම්කාරයා ඔහුගේ ඉල්ලුම්පත්‍රයේ සඳහන්වෙන මුදලෙන් දහයෙන් පංගුවක් කාසිවලින් කොන්ත්‍රාත් එකේ වැඩකිරීම පිණිස ඇපදෙන්ට ඕනෑය. නොතාරිස් කෙනෙක් විසින් ලියනලද ඔප්පුවකට අත්සන්කරන්ට ඕනෑය. එම ඔප්පුවේ ගාස්තුද ඔහු විසින් දරාගන්ටත් ඕනෑය.

(4) ඉතාම අඩු ඉල්ලීම නොහොත් වෙන කිසියම් ඉල්ලීමක් වත් බාරගැනීමට බෝඩ්එක බැඳීසිටින්නේ නැත.

(5) වැඩිපුර කාරණා පුත්තලමේ කච්චේරියේ සැනිටරී බෝඩ් කන්තෝරුවෙන් දැනගන්ට පුළුවන.

අත්සන්කළේ, ඩබ්ලිව්. ඒ. වේට්,
සභාපතිතැන.

වර්‍ෂ 1919ක්වූ ඔක්තෝබර් මස 2වෙනි දින
පුත්තලමේ සැනිටරීබෝඩ් කන්තෝරුවේදීය.

---

1920වෙනි අවුරුද්දේ මාදම්පේ සැනිටරීබෝඩ් සීමාව තුළ තිබෙන ලාම්පු පත්තුකිරීමේ කොන්ත්‍රාත්එකයි.

1920වෙනි වර්‍ෂයතුළ මාදම්පෙ නගරයේ ලාම්පු පත්තුකිරීමේ කොන්ත්‍රාත්එක ගැනීම පිණිස ටැන්ඩර්ස් නොහොත් ඉල්ලුම් පත්‍ර නොවැම්බර් මස 22වෙනි සෙනසුරාදා දවල් 2ක වෙනතුරු පුත්තලමේ කච්චේරියේදී මාදම්පේ සැනිටරීබෝඩ් සභාපති තැන විසින් බාරගන්නවා ඇත.

(1) 1920වෙනි අවුරුද්ද ඇතුළත මාදම්පේ නගරයේ ලාම්පු පත්තුකිරීමේ කොන්ත්‍රාත්එකේ ටැන්ඩරය නොහොත් ඉල්ලුපත්‍රය යන වචන ඉල්ලුම්කාරයා ඔහුගේ ඉල්ලුම්පත්‍රය පිට ලියන්ට ඕනෑය. එම ඉල්ලුම්පත්‍රය රුපියල් 5කුත් සමග එවන්ට ඕනෑය.

(2) පැට්රල්, බූමිතෙල්, මැන්ටල්ස්, ලාම්පු, නූල්, චිමිනිද සපයාගන ලාම්පු පත්තුකරන්නෝ පත්කරගන පැට්රල් ලාම්පු 1ක්ද, බූමිතෙල් ලාම්පු 10ක්ද දලුහදෙන් දවස් පහකට පස්සේ සිට පසළොස්වක පසුවී දවස් 2ක් යනතුරු කාලය අත් හැරෙන්ට ඉතුරු කාලයේ දවස්පතා සැන්දෑවේ 6යේ සිට රාත්‍රි 12හ වෙනතුරු පත්තුකිරීමට ඉල්ලාසිටින මුදල ඉල්ලුම් කාරයා ඔහුගේ ඉල්ලුම්පත්‍රයේ සඳහන්කරන්ට ඕනෑය.

(3) පාවිච්චිකරන්ට යෝජනාකරන තෙල්වල බෑන්ඩ් මාර්ක් ලකුණ ඉල්ලුම්පත්‍රයේ සඳහන්කරන්ට ඕනෑය.

(4) තෝරගත් ඉල්ලුම්කාරයා ඔහුගේ ඉල්ලුම්පත්‍රයේ සඳහන්වෙන මුදලෙන් දහයෙන් පංගුවක් කාසිවලින් කොන්ත්‍රාත් එකේ වැඩකිරීම පිණිස ඇපදෙන්ට ඕනෑය. නොතාරිස් කෙනෙක් විසින් ලියනලද ඔප්පුවකට අත්සන්කරන්ට ඕනෑය. එම ඔප්පුවේ ගාස්තුද ඔහු විසින් දරාගන්ට ඕනෑය.

(5) ඉතාම අඩු ඉල්ලීම නොහොත් වෙන කිසියම් ඉල්ලීමක් වත් බාරගැනීමට බෝඩ්එක බැඳීසිටින්නේ නැත.

(6) වැඩිපුර කාරණා පුත්තලමේ කච්චේරියේදී සැනිටරී බෝඩ් කන්තෝරුවෙන් දැනගන්ට පුළුවන.

අත්සන්කළේ, ඩබ්ලිව්. ඒ. වේට්,
සභාපතිතැන.

වර්‍ෂ 1919ක්වූ ඔක්තෝබර් මස 10වෙනි දින
පුත්තලමේ සැනිටරීබෝඩ් කන්තෝරුවේදීය.

---

## රා සහ අරක්කු තැබෑරුම් සම්බන්ධ වර්‍ෂ 1912යේ අඩංක 8 දරන ව්‍යවස්ථාව යටතේ දැන්වීම.

**රා සහ අරක්කු තැබෑරුම් සම්බන්ධව වර්‍ෂ 1912ක්වූ අංක 8ට දරණ ව්‍යවස්ථාව යටතේ දැන්වීම.**

වර්‍ෂ 1919ක්වූ මාර්තු මස 12වෙනි දින නොම්මර 87 දරණ මත්පැන් සම්බන්ධ දැන්වීමේ ප්‍රකාශකරණලද පනත්වල නොම්මර 5හේ පණතෙන් දෙනලද බලය ප්‍රකාර මධ්‍යම පලාතේ මාතලේ දිස්ත්‍රික්කේ උප ඒජන්ත උන්නාන්සේ විසින් මෙහි පහත දක්වන තැබෑරුම්වලින් ප්‍රයෝජනය දරණලද පලාත් වල පදිංචි ඇසබඳ වෙන අයවලුන්ගෙන් සියේට 75දෙනෙක් බැගින් ඒ පලාත්වල රා විකිණීම පිණිස තැබෑරුම් පිහිටුවීමට විරුඩද නැද්ද යන වග දැනගැණීම පිණිස කැමැත්ත දෙන අයවලුන් ගණන් ගැණීමට මෙහි පහත දක්වන දින සහ ස්ථාන නියමකර තිබෙන බව මහජනයාගේ දැනගැණීම පිණිස මෙයින් ප්‍රකාශකරණු ලැබේ.

1. උඩස්ගිරිය රා තැබෑරුම ගැන වර්‍ෂ 1919ක්වූ නොවැම්බර් මස 11වෙනි දින් පස්වරු 1 පටන් 4.30 දක්වා යටවත්තේ "සර්කිට් බංගලාව" නොහොත් ගමන්වාඩියේදීය. මෙම තැබෑරුමෙන් ප්‍රයෝජන දරණ ගම්නම් උඩස්ගිරිය සහ අඹන් පොල වසම්වල ගම්ය.

2. වේරගම රා තැබෑරුම ගැන වර්‍ෂ 1919ක්වූ නොවැම්බර් මස 13වෙනි දින පස්වරු 1 පටන් 4.30 දක්වා වේරගම තිබෙන වීරකෝන්කන්දේ බණමඩුවේදීය. මෙම තැබෑරුමෙන් ප්‍රයෝජනය දරණ ගම්නාම් වේරගම වසමේ ගම්ය.

ඒ. ටී. මිලින්ටන්,
මාතලේ උප ඒජන්ත උන්නාන්සේ.

වර්‍ෂ 1919ක්වූ ඔක්තෝබර් මස 3වෙනි
දින මාතලේ කච්චේරියේදීය.

## ආණ්ඩුවේ ඉඩම් මිලේට ගැනීම සම්බන්ධ ඉල්ලුම්පත්‍ර.

වයඹ දිසාවේ ආණ්ඩුවේ ඉඩම් මිලේට ගැනීමට ඉල්ලුම්පත්‍ර සම්බන්ධ ඉඩම් මැනීමේ පිළිවෙළ මෙසේයි:—

වයඹ දිසාවේ ආණ්ඩුවේ ඉඩම් මිලේට ගැනීමට හෝ බදු ගැනීමට ඉල්ලුම්පත්‍ර සම්බන්ධ මැනීම මෙහි පහත පෙනෙන පිළිවෙළට මින් පසු කරනුලැබේ.

1. එම දිසාව කොට්ඨාස තුනකට බෙදනලදී, එනම් :— නොම්බර 1 කොට්ඨාසය, කුරුනෑගල දිස්ත්‍රික්කය. නොම්බර 2 කොට්ඨාසය, හලාවත දිස්ත්‍රික්කය. නොම්බර 3 කොට්ඨාසය, පුත්තලම් දිස්ත්‍රික්කය.

2. ඉහත කියනලද තුන්වෙනි කොට්ඨාසයට අයිති ඉඩම් මැනීමට ඉල්ලුම්පත්‍ර වර්ෂ 1919ක්වූ දෙසැම්බර් මස 1වෙනි දින පටන් (දෙවනු දන්වනතුරු) සර්වේයර් ජනරාල් උන්නාන්සේට යවන්නේ නැත. ඒ කොයිහැටිවුනත් කච්චේරියේ සටහන්කර තිබීමට සහ විකිනීමට හෝ බදුදීමට බාධාවක් ඇද්ද යන වග දැනගැනීමට පිණිස යමෙක් ඉඩම් ඉල්ලුම් කරන්ට කැමතිනම් එසේ කළහැක.

3. මැනීම සම්බන්ධ ඉල්ලුම්පත්‍ර ඊලඟට යවන්නේ නැත්තේ පළමුවෙනි කොට්ඨාසයෙහිද, ඊලඟට දෙවෙනි කොට්ඨාසයෙහිත්ය. මේ කොට්ඨාස දෙක්හි ඉඩම් මිලේට ගැනීමට හෝ බදු ගැනීමට ඉල්ලුම්පත්‍ර හැකි ඉක්මනින් පළමුවෙනි කොට්ඨාසයේ ඒවා කුරුනෑගල මහේජන්තතුමා වෙතද, දෙවෙනි කොට්ඨාසයේ ඒවා මා වෙතද එවිය යුතුයි.

4. පළමුවෙනි කොට්ඨාසය සම්බන්ධ මැනීමට ඉල්ලුම්පත්‍ර යැවීම නවත්වනු ලබන දිනය ලඟදී ප්‍රසිද්ධකරණු ලැබේ. එම දිනය නම් තුන්වෙනි කොට්ඨාසයේ වැඩ අවසානවෙන දිනය වේ.

ඇස්. ඇම්. පී. වැන්ඩර්කෝන්,
පුත්තලම් සහ හලාවත ආණ්ඩුවේ උප ඒජන්ත වම්හ.

වර්ෂ 1919ක්වූ ඔක්තෝබර් මස 11වෙනි
දින පුත්තලම් කච්චේරියේදීය.

## සනීපාරක්ෂක සභාවලට නිලනොලත් සමාජිකයින් තෝරාගැනීමේ දැන්වීම.

මාතර නගරයේ "ලෝකල් බෝඩ්" හෙවත් සනීපාරක්ෂක සහ නගරාභිවෘද්ධික සභාවේ මෙහි පහත සඳහන්වෙන නගර කොඨාස පිළිබඳව ක්‍රියාකිරීම සඳහා වෙන් වෙන් වශයෙන් ආණ්ඩුවේ නිලනොලත් සාමාජිකවරු තුන්දෙනෙක් පත්කර ගැනීම සඳහා වර්ෂ 1898වේ නොම්මර 13 දරන ලෝකල් බෝඩ් හෙවත් සනීපාරක්ෂක සහ නගරාභිවෘද්ධික ආඥාපණතේ රෙගුලාසිවල ප්‍රකාරයට සහ වර්ෂ 1916යේ නොම්මර 27 දරණ අළුත්වැඩියාකිරීමේ ආඥාපණතේ 9වෙනි වගන්තියේ ප්‍රකාර යටත් සමූහයාගේ කැමැත්තෙන් පත්කිරීමක් වර්ෂ 1919ක්වූ දෙසැම්බර් මස 1වෙනි සඳුදා පෙරවරු 9 කනිසමට මාතර කච්චේරියේදී පවත්වන්ට මවිසින් අදහස්කර තිබෙන බව ප්‍රසිද්ධලෙස මෙයින් දැනුම්දෙමි.

2. සාමාජිකවරුන් තෝරාගැණීම පිණිස කැමැත්තදීමට සුදුස්සන්ගේ නම් සඳහන්කරපු ලැයිස්තුවල පේන අයවලුන් ගෙන් අඩුගණනේ දෙදෙනෙක් විසින් අත්සන්කරපු ලියවිල්ල කින් නියමකරණුලැබූ ඉල්ලුම්කාරයෙක් මිස වෙන කෙනෙක් එකී සාමාජික ධූරයක ඉල්ලුම්කාරයෙක් විය නොහැකිය. තවද එකී සාමාජිකයින් තෝරාගැනීම නියමවූ දිනට දවස් දහයකට අඩුනුවූ කාලයක් ඇතුළත හෙවත් වර්ෂ 1919ක්වූ නොවැම්බර් මස 21වෙනි සිකුරාදට මත්තෙන් ඉල්ලුම්කාර සින් නියමකිරීමේ ලියමන් ලෝකල් බෝඩ් හෙවත් සනීපාරක්ෂක සහ නගරාභිවෘද්ධික සභාවේ කන්තෝරුවට භාරදිය යුතුයි.

කොඨාසවල නම්.

1. උතුරු කොඨාසය. | 2. දකුණු කොඨාසය.
3. බස්නාහිර කොඨාසය.

ජේ. ඞී. බ්‍රවුන්,
මාතර ආණ්ඩුවේ උප ඒජන්තතැන.

වර්ෂ 1919ක්වූ ඔක්තෝබර් මස 1වෙනි
දින මාතර කච්චේරියේදීය.

## අ නා ථ දැ න් වී ම.

අළුත්කුරුකෝරළේ රගම්පත්තුවේ නාගොඩ පදිංචි හෙට්ටිගේ දොන් ප්‍රන්සිස් සමරනායක වන මම වර්ෂ 1907තේ අංක 1 දරණ ආඥාපණතට යාකර තිබෙන අංක 1B අක්ෂරය දරණ ෂැඩ්යුල් පත්‍රයේ දෙවෙනි වගන්තියට අනුව නුවර දිස්ත්‍රික්කේ සිංහල භාෂාවෙන් ප්‍රසිද්ධ නොතාරිස් කෙනෙකු මෙන් කටයුතු කිරීමට පත්කරණුලැබීම පිණිස මෙතැන් සිට තුන් මාසයක් ගියතැන රෙජිස්ත්‍රාර් ජනරාල්තුමාගෙන් ඉල්ළුම්කරණ බව මෙයින් දැනුම්දෙමි.

වර්ෂ 1919ක්වූ සැප්තැම්බර් මස 30වෙනි දිනදීය. හෙ. දො. ප්‍ර. සමරනායක.

H. R. COTTLE, ACTING GOVERNMENT PRINTER, COLOMBO, CEYLON.